(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 10.]

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2015 ඔක්තෝබර් මස 21 වැනි බදාදා අ. භා. 1.00 ට

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/'15

1\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි 16 වැනි වගන්තියට අනුව, පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ඉහත 16 වැනි වගන්තියෙහි නියමයන් ඉටු නොකළේ නම්, එම තත්ත්වයට බලපෑ හේතූන් කවරේද;

(iii) ඉහත 16 වැනි වගන්තියෙහි (2) උපවගන්තියෙහි නියමයන් ඉටුකරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10/'15

2\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එවකට පැවති ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධිත ඕෂන් වීව් ඩිවලප්මන්ට් (ප්‍රයිවට්) සමාගම ඉදිකරන ලද මත්තේගොඩ හා කහතුඩුව නිවාස සංකීර්ණවල නිවාස කිහිපයක් පුද්ගලයින්ට ලබාදීමේ දී රු. මිලියන 60කට අධික මුදලක් අවභාවිත කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් නිවාස වර්ග අලෙවි කිරීමට තීරණය කරන ලද මුදල කවරේද;

(ii) එම නිවාස සඳහා පහසු ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දී තිබුණේද;

(iii) එසේ නම්, නිවාස වර්ගය අනුව ගෙවිය යුතු පළමු වාරිකය හා සෙසු වාරික මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කහතුඩුව නිවාස සංකීර්ණයේ අංක B–5, B4–10, B3–35 සහ B2–36 සහ මත්තේගොඩ නිවාස සංකීර්ණයේ D–16 හා B-10 යන නිවාස ලබා දී ඇති පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඔවුන් සහ හිටපු අමාත්‍යවරයා අතර ඥාතිත්වය කවරේද;

(iii) එම නිවාස සඳහා ඔවුන් දැනට ගෙවා ඇති සහ ගෙවීමට ඉතිරිව ඇති මුදල කොපමණද;

(iv) හිඟ මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(v) නිවාස බෙදා දීමේදී සිදු වූ දූෂිත ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන්නේද;

(vi) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

18/'15

3.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ එවකට සිටි සභාපතිවරයාගේ නිර්දේශය පරිදි, කොමිසමේ විෂය පථයට පරිබාහිරව වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා යැයි පවසමින් 2013 අගෝස්තු මාසයේදී තාරුණ්‍යයට හෙටක් සංවිධානයට ලබා දුන් රුපියල් ලක්ෂ 50ක මුදල, සිලෝන් ප්‍රිමියර් ස්පෝර්ට්ස් ලිමිටඩ් නම් කොටස් වෙළඳපොළ හෝ මූල්‍ය කටයුතු පිළිබඳ කිසිදු සම්බන්ධයක් නොමැති සමාගමකට ගෙවීමෙන් සිදුකර ඇති මූල්‍ය වංචාව පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වංචාව පිළිබඳ විමර්ශන කටයුතු වල වර්තමාන තත්ත්වය කවරේද;

(ii) ඊට සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගෙන තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වංචා කරන ලද මුදල් අයකර ගැනීම සඳහා කොමිසම ගනු ලැබූ හෝ ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් ආයතනික මට්ටමින් විමර්ශනයක් කර තිබේද;

(iii) මෙම මුදල් ලබාගත් සිලෝන් ප්‍රිමියර් ස්පෝර්ට්ස් සමාගමේ අධ්‍යක්ෂවරුන් කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මෙම මූල්‍ය වංචාව පිළිබඳව පොදු දේපළ පනත යටතේ විමර්ශනය කොට චූදිතයන්ට එරෙහිව කටයුතු කිරීමට ඇති බාධාව කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

24/'15

4.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාත් සභාවට අයත් කාපට් ඇතිරීම සඳහා මූලික සූදානම් කිරීම් කළ මහාමාර්ග 18ක වැඩ 2015 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අතරමග නවතා දමා ඇති බවත්;

(ii) කැකණඳුර සිට වේහැල්ල හරහා දික්වැල්ල දක්වා වූ මාර්ගය ප්‍රවාහනයට තබා ඇවිදයාමට පවා අපහසු අයුරින් අබලන්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) i හි සඳහන් අළුත්වැඩියා කටයුතු අතරමග නවතා දමා ඇති මාර්ග 18 කවරේද;

(ii) ඉහත (අ) ii හි සඳහන් මාර්ගයෙහි කාපට් ඇතිරීම සිදුකරන දිනය කවරේද;

(iii) මහා භාණ්ඩාගාරය විසින් මෙම මහාමාර්ග සඳහා වෙන්කොට ඇති හෝ වෙන්කරන බවට පොරොන්දු වී ඇති මුදල කොපමණද;

(iv) ඒ අනුව, මෙම මහා මාර්ගයන්හි කාපට් ඇතිරීම සඳහා වූ ඉදිරි වැඩපිළිවෙළ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

27/'15

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂය තුළ වාර්තා වූ ළමා අපචාර සිදුවීම් සංඛ්‍යාව, ස්ත්‍රී දූෂණ සිදුවීම් සංඛ්‍යාව හා මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත සිදුවීම්වලට වැරදිකරුවන් වූ රාජ්‍ය නිලධාරීන් හා දේශපාලනඥයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා අනෙකුත් තොරතුරු කවරේද;

(iii) එම නිලධාරීන්ට හා දේශපාලනඥයන්ට ලබාදුන් දඬුවම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ළමා අපචාර, ස්ත්‍රී දූෂණ හා මත්ද්‍රව්‍ය වැරදි සඳහා මෙරට ක්‍රියාත්මක නීති ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම නීති සංශෝධනයට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

79/'15

6.

ගරු චන්දිම ගමගේ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර පහක පමණ කාලයක සිට අලි - මිනිස් ගැටුම උග්‍ර අතට හැරුණු අතර එමගින් අදටත් මිනිස් ජීවිත මෙන්ම අලි සම්පත ද විනාශ වෙමින් පවතින බවත්;

(ii) අවිධිමත්ව හා සැලසුමකින් තොරව විදුලි වැටවල් ඉදිකිරීම තුළින් වන අලින්ගෙන් ගම්මාන ආරක්ෂා වීම වෙනුවට අසාධාරණ ලෙස තමන්ගේ ඉඩකඩම් හා ගේ දොර අහිමිවීමෙන් ගම්මානවල ජීවත්වන ජනතාව අසරණ භාවයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය කාලයේදී ඉදිකල හා ඉදිකිරීමට යෝජිත විදුලි වැට ව්‍යාපෘති ගණන කොපමණද;

(ii) විදුලි වැට ඉදිකර ඇති දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට අක්‍රියව ඇති විදුලි වැටවල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (අ) ii හි සඳහන් සිද්ධීන්වලට මුහුණ දුන් ජනතාවට සාධාරණය ඉටු කිරීම පිණිස හා එවැනි පැමිණිලි භාර ගැනීමට නිසි ක්‍රමවේදයක් අමාත්‍යාංශය තුළ ස්ථාපනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4/'15

7.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි 17 වැනි වගන්තියෙහි (අ); (ආ); (ඇ) සහ (ඈ) උපවගන්තිවල දක්වා ඇති තොරතුරු එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13/'15

8.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් සිල් රෙදි ඇතුළු විවිධ ද්‍රව්‍ය ඡන්ද දායකයාට බෙදාදීම සඳහා රුපියල් මිලියන 600 ක රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් එවකට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති වූ, හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා සහ එවකට අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට යන අයට එරෙහිව ගෙන ඇති ආයතනික ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් සිදුකරනු ලබන මූල්‍ය අපරාධ විමර්ශනයන්ගේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) මහා පරිමාණ මූල්‍ය අපරාධයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට අදාළ වගකිවයුතු බලධාරීන් මැලි වන්නේ නම්, ඔවුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයට අහිමි වූ රුපියල් මිලියන 600 ක මුදල අයකර ගැනීම සඳහා විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) විදුලි සංදේශ නියාමන කොමිසමේ මුදල් උපයෝගී කර ගනිමින් සිල් රෙදි බෙදා දීම හැරුණු විට 2015 ජනාධිපතිවරණයට අදාළව සිදුකරන ලද අනෙකුත් රාජ්‍ය මූල්‍ය අවභාවිතයන් කවරේද;

(iii) ඊට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

51/'15

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සංඥා පද්ධතිය මේ වනවිට අර්බුදයකට ලක් වී ඇති බවත්;

(ii) එම නිසා මගී ජනතාවගේ ජීවිත අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බවත්;

(iii) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අනුර පුෂ්පකුමාර කස්තුරි මහතා විසින් නවීන තාක්ෂණය භාවිතා කරමින් සුළු මුදලකින් ක්‍රියාත්මක කළ හැකි සාර්ථක දුම්රිය ආරක්ෂක පද්ධතියක් නිර්මාණය කර ඇති බවත්;

(iv) එය ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා භාවිතා කිරීමට නියමිතව තිබුණද මෙතෙක් භාවිතයට නොගැනීම ගැටලුවක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් ආරක්ෂක පද්ධතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(ii) එම ආරක්ෂක පද්ධතිය හෝ වෙනත් ආරක්ෂක පද්ධතියක් දුම්රිය සේවයට එක් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2015.10.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2015 ඔක්තෝබර් මස 22 වැනි බ්‍රහස්පතින්දා සහ 23 වැනි සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අල්හසන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 25 දිනැති අංක 1907/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අප්‍රේල් 1 දිනැති අංක 1908/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 11),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අප්‍රේල් 23 දිනැති අංක 1911/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 12),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූනි 5 දිනැති අංක 1917/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 13),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූනි 16 දිනැති අංක 1919/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 14),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූනි 29 දිනැති අංක 1921/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 15),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජූලි 20 දිනැති අංක 1924/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 16),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 7 දිනැති අංක 1931/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 17),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 5 දිනැති අංක 1913/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.10.06 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.09.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.09.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව (අංක 3),— (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.10.06 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 මැයි 5 දිනැති අංක 1913/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),—"2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

	අයිතමය	සංශෝධනය
(i)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 1,700,000,000 සිට රු. 2,200,000,000 දක්වා
(ii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	සංශෝධන නොමැත
(iii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	රු. 6,102,000,000 සිට රු. 6,602,000,000 දක්වා
(iv)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	රු. 850,000,000 සිට රු. 1,000,000,000 දක්වා

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14 වැනි දින,
කොළඹ 01."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),—"2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

	අයිතමය	සංශෝධනය
(i)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	සංශෝධන නොමැත

(ii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	සංශෝධන නොමැත	
(iii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	රු. 20,000,000 රු. 25,000,000	සිට දක්වා
(iv)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත	

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14 වැනි දින,
කොළඹ 01.”

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),— “ 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය, රවි කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම, පරිවර්තන ගාස්තු හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

	<u>අයිතමය</u>	<u>සංශෝධනය</u>	
(i)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	සංශෝධන නොමැත	
(ii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	රු. 2,900,000,000 රු. 2,500,000,000	සිට දක්වා
(iii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	සංශෝධන නොමැත	

(iv)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	රු. 1,500,000,000 සිට රු. 2,250,000,000 දක්වා	

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14 වැනි දින,
කොළඹ 01."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),— "2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 - "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

	අයිතමය	සංශෝධනය
(i)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 120,000,000 සිට රු. 170,000,000 දක්වා
(ii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	සංශෝධන නොමැත
(iii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	සංශෝධන නොමැත
(iv)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14 වැනි දින,
කොළඹ 01."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),— "2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය, රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 - " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

	අයිතමය	සංශෝධනය
(i)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව	රු. 260,000,000 සිට රු. 450,000,000 දක්වා
(ii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව	සංශෝධන නොමැත
(iii)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව	සංශෝධන නොමැත
(iv)	එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව	සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14 වැනි දින,
කොළඹ 01."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 සැප්තැම්බර් 23),— "2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් සාදන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතු ය.

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

උපලේඛනය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

අනු අංකය	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	විෂය අංකය	II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව		III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව		IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව		නියෝග අංකය
			සිට	දක්වා	සිට	දක්වා	සිට	දක්වා	
			රු.	රු.	රු.	රු.	රු.	රු.	
1	පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය	14001	7,000,000	10,000,000	3,700,000	4,000,000	-	-	1
2	විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය	18201	5,000,000	8,000,000	1,100,000	4,100,000	-	-	2
3	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	10501	140,000,000	170,000,000	60,000,000	90,000,000	-	-	3
4	උසාවි පරිපාලනය	22801	260,420,000	290,420,000	170,000,000	175,000,000	850,000,000	1,100,000,000	4
5	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	20801	9,000,000	12,000,000	-	-	-	-	5
6	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල	27701	-	-	25,000,000	24,000,000	-	-	6
7	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව	30301	-	-	3,000,000	2,900,000	-	-	7

8	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව	26901	-	-	23,000,000	18,000,000	90,000,000	100,000,000	8
9	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර	27001	-	-	35,000,000	30,000,000	-	-	9
10	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල	27201	-	-	75,000,000	65,000,000	-	-	10
11	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	24201	-	-	2,000,000	1,700,000	-	-	11
12	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	28601	-	-	12,000,000	11,500,000	-	-	12
13	මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය	10201	15,000,000	12,000,000	9,500,000	8,500,000	-	-	13
14	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ	25601	-	-	56,000,000	53,000,000	-	-	14
15	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර	25801	-	-	51,000,000	46,000,000	-	-	15
16	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	28201	-	-	100,000,000	97,000,000	-	-	16
17	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	28501	-	-	150,000,000	120,000,000	-	-	17
18	සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	11601	6,000,000	7,500,000	-	-	-	-	18
19	මිනුම්පති දෙපාර්තමේන්තුව	28801	-	-	100,000,000	86,000,000	-	-	19
20	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	30601	-	-	385,000,000	290,000,000	-	-	20
21	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල	27901	-	-	30,000,000	26,000,000	-	-	21
22	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර	27801	-	-	38,000,000	32,000,000	-	-	22
23	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර	27401	-	-	40,000,000	35,000,000	-	-	23
24	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව	27501	-	-	18,000,000	15,000,000	-	-	24
25	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	21901	8,000,000	8,011,000	-	-	-	-	25

26	පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය	17801	4,000,000	5,000,000	-	-	-	-	26
27	අධ්‍යාපන අමාත්‍යාංශය	12601	-	-	680,000,000	675,000,000	-	-	27
28	සෞඛ්‍ය අමාත්‍යාංශය	11101	-	-	710,000,000	653,000,000	-	-	28
29	උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය	18801	2,000,000	2,060,110	-	-	-	-	29
30	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	21101	-	-	45,000,000	44,000,000	-	-	30
31	නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය	19001	-	-	83,000,000	60,000,000	-	-	31
	එකතුව		456,420,000	524,991,110	2,905,300,000	2,666,700,000	940,000,000	1,200,000,000	

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.09.14
කොළඹ 01."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**